**ශීර්ෂය 116 -වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 116 - වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශන වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 18 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයට පවරා තිබූ රු. 10,000,000 ක් වටිනා මෝටර් රථයක් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් වාර්තාවට ඇතුලත් කිරීමට සටහන් කර ගත් බව. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | රු. 1,193,790 ක් වටිනා කාර්යාල උපකරණ රාජ්‍ය ආයතන දෙකක් වෙත නිකුත් කර තිබුණද, එම උපකරණ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙන් ඉවත් නොවීම නිසා එම ප්‍රමාණයෙන් වත්කම් වැඩියෙන් දක්වා තිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී මෙම අමාත්‍යාංශය වෙත ඒකාබද්ධ වීමත් සමඟ එහි පැවති භාණ්ඩ මෙම අමාත්‍යාංශය වෙත ගෙන ඒමේදී අමාත්‍යාංශ විෂය පථය යටතේ ඇති ආයතනය හා දෙපාර්තමේන්තුව වෙතින් ලද ඉල්ලීම් අනුව මූල්‍ය නොවන වත්කම් නිකුත් කරනු ලැබීය. එම අමාත්‍යාංශයේ වත්කම් පිළිබඳ තොරතුරු CIGAS පරිගණක පද්ධතිය වෙත එම අමාත්‍යාංශය විසින් ඇතුළත් කර තිබූ බැවින් සැසඳීම් සිදුකිරීමෙන් අනතුරුව මේවන විට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙන් ඉවත් කර ඇති බව. | -එම- |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **නිරීක්ෂණය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i)මුදල් රෙගුලාසි 103 (අ) හා 104 | a) රාජ්‍ය අමාත්‍යාංශයෙන් ලබාගත් භාණ්ඩ වර්ග 12 කට අයත් අයිතම් 42 ක හිඟ භාණ්ඩ පැවැති නමුත් ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල බලධාරීන්ට වාර්තා කිරීම හා ඊට වගකිවයුත්තන් නිෂ්වය කිරීම සිදු කර නොතිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී මෙම අමාත්‍යාංශය වෙත ඒකාබද්ධ වීමත් සමඟ එහි සේවය කල මාණ්ඩලික නිලධාරීන් පිරිසක් අදාල නිලධාරීන් සමඟ සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව වෙත ඉන්වෙන්ට්‍රි භාණ්ඩ රැගෙන ගොස් තිබූ අතර තවත් පිරිසක් මෙම අමාත්‍යාංශ ගොඩනැඟිල්ල වෙත පැමිණ තිබුණි. 2023 මාර්තු මස වන විට ඉන්වෙන්ට්‍රි භාරව කටයුතු කර තිබූ නිලධාරීන් සඳහා ස්ථාන මාරු වීම්ද ලබා දී තිබුණි. එම භාණ්ඩ රැගෙන ඒම සඳහා කමිටුවක් පත් කර තිබූ අතර ඒ වන විට ඉන්වෙන්ට්‍රි ලේඛන ලබා දෙන ලෙස ඉල්ලීම් කලද ඉන්වෙන්ට්‍රි ලේඛන ලබා දී නොතිබූ බැවින් භෞතිකව භාණ්ඩ භාර දීම හා භාර ගැනීම අත්සන් කොට ලබා ගෙන ඇති බව | අදාල බලධාරීන්ට වාර්තා කිරීමට හා ඊට වගකිවයුත්තන් නිෂ්වය කිරීමට කටයුතු කළ යුතුය. |
| | | b) 2023 වර්ෂය තුල අනතුරු වලට භාජනය වී තිබූ වාහන 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii)මුදල් රෙගුලාසි 1646 | අමාත්‍යාංශයේ ඉන්ධන ලේඛනය අනුව 2023 වර්ෂයේදී වාහන 11 ක් සඳහා රු. 1,792,291 ක් වටිනා ඉන්ධන ලීටර් 5,512 ක් උපයෝජනය කර තිබුණි. සෑම වාහනයක් සඳහාම ධාවන සටහන් ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණනයට ඉදිරිපත් කලයුතු වුවද ඉන්ධන භාවිතා කළ ආකාරය පිළිබඳ දැක්වෙන 2023 වර්ෂයේ ධාවන සටහන් කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රමාදයන් සිදු වී ඇත. ඉදිරියේදී විධිමත්ව ඉදිරිපත් කිරීමට සටහන් කර ගත් බව | -එම- |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | වාහන සඳහා ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කලයුතු වුවද අමාත්‍යාංශයේ සංචිත වාහන 3 ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | එම සංචිත වාහන අලුත්වැඩියාවන් සඳහා යොමු කිරීමට නියමිත අතර අලුත්වැඩියාව නිමවූ වහාම ඉන්ධන පරීක්ෂාව සිදු කරන බව | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | |
| 4 ඡේදය | 2023 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර සමස්ථ කාර්යමණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | ඉදිරියේදී පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි II කොටස | | | |
| 8.1.3 ඡේදය | රාජ්‍ය අමාත්‍යාංශයේ වත්කම් අමාත්‍යාංශය වෙත මාරු කිරීමේදී අදාළ අමාත්‍යාංශ ද්විත්වය විසින් එම වත්කම් තක්සේරු කිරීමට ඒ සම්බන්යෙන් නිපුණත්වයෙන් යුත් පුද්ගලයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කළ යුතු අතර එම කමිටුව විසින් සිදු කරන තක්සේරු වටිනාකමට වත්කම් මාරු කිරීම සිදු කළ යුතු නමුත් අමාත්‍යාංශය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී මෙම අමාත්‍යාංශය වෙත ඒකාබද්ධ වීමත් සමඟ එහි සේවය කල මාණ්ඩලික නිලධාරීන් පිරිසක් අදාල නිලධාරීන් සමඟ සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව වෙත ඉන්වෙන්ට්‍රි භාණ්ඩ රැගෙන ගොස් තිබූ අතර තවත් පිරිසක් මෙම අමාත්‍යාංශ ගොඩනැගිල්ල වෙත පැමිණ තිබුණි. 2023 මාර්තු මස වන විට ඉන්වෙන්ට්‍රි භාරව කටයුතු කර තිබූ නිලධාරීන් සඳහා ස්ථාන මාරු වීම්ද ලබා දී තිබුණි. එම භාණ්ඩ රැගෙන ඒම සඳහා කමිටුවක් පත් කර තිබූ අතර ඒ වන විට ඉන්වෙන්ට්‍රි ලේඛන ලබා දෙන ලෙස ඉල්ලීම් කලද ඉන්වෙන්ට්‍රි ලේඛන ලබා දී නොතිබූ බැවින් භෞතිකව භාණ්ඩ භාර දීම හා භාර ගැනීම අත්සන් කොට ලබා ගෙන ඇති බව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2022 අප්‍රේල් 04 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2022 හි 02 (II) වගන්තිය | ස්ථාන මාරුවීම් ලබන නිලධාරින් විසින් අදාල ආයතනය සතු කිසිදු මූල්‍ය නොවන වත්කමක් රැගෙන යාම නොකල යුතු වුවද ඊට පටහැනි ලෙස ස්ථානමාරුවීම් ලැබ ගිය නිලධාරින් තුන්දෙනෙකු විසින් පරිගණක උපාංග 08 ක් ස්ථානමාරු ලැබූ ස්ථානවලට රැගෙන ගොස් තිබුණි. | නිලධාරීන් ස්ථාන මාරු වීමකදී සේවයෙන් නිදහස් කරන විට ඉන්වෙන්ට්‍රි භාර දීම සම්බන්ධව අදාල නිලධාරීන් දැනුවත් කර ඇති බව | -එම- |

## 2.2 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------------- | ------------------------------- | ------------------- |
| (අ) | අමාත්‍යාංශයේ බිම් මහලේ වර්ග අඩි 2,178 ක ප්‍රමාණයක ස්ථාපිත කර ඇති වෙළඳසැල 2022 ඔක්තෝබර් සිට 2023 අගෝස්තු දක්වා සමූපකාර තොග වෙළඳ සංස්ථාව විසින්ද, 2023 අගෝස්තු සිට විගණිත දින දක්වා උමන්දාව ග්‍රීන් හට් නැමති ආයතනය විසින්ද ව්‍යාපාර කටයුතු කරගෙන ගොස් තිබුණු අතර ඒ සඳහා අමාත්‍යාංශ වැය ශීර්ෂය මඟින් 2023 දෙසැම්බර් 31 දක්වා රු. 5,414,565 ක කුලී මුදල්, විදුලි බිල්, ජල බිල්පත් දරා තිබුණි. විධිමත් ගිවිසුමක් මත අදාල ආයතන වලින් එම මුදල් අයකර ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණු අතර එම වෙළඳසැල ස්ථාපිත කිරීමේ මූලික වියදම ලෙස රු. 2,000,000 ක මුදලක් 2021 වර්ෂයේ දී අමාත්‍යාංශය විසින් සමූපකාර තොග වෙළඳ සංස්ථාව වෙත ගෙවා තිබුණි. | 2023 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි, මාර්තු, අප්‍රේල්, මැයි, ජූලි, සැප්තැම්බර්, ඔක්තෝබර් හා නොවැම්බර් යන මාසයන්හි විදුලි බිල හා 2023 සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසයන්හි කුලී මුදල් මේ වන විට ප්‍රතිපූර්ණය කර ඇති බව. | අදාල පාර්ශවයන්ගෙන් අයවිය යුතු මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අමාත්‍යාංශය විසින් 2023 ජුනි 16 සිට 2023 දෙසැම්බර් 12 දක්වා වූ කාල පරාසය තුල වසර 02 ක කොන්ත්‍රාත් කාලයකට වෙළඳ ප්‍රදර්ශන සම්බන්ධීකරණ නිලධාරීන් 05 දෙනෙකු සහ කළමනාකරණ සහකාරවරු 03 දෙනෙක් සඳහා පත්වීම් ලබාදී තිබූ අතර ඔවුන්ගේ පත්වීම් වල නීත්‍යානුකුලභාවය, බඳවාගැනීමේ ක්‍රියාවලිය, ඔවුන්ගේ දීමනා තීරණය කිරීමේ පදනම, රාජකාරී පැවරුම් කිරීම, රාජකාරී සඳහා වාර්තා කරන ස්ථාන, ආසන්නතම අධීක්ෂණ නිලධාරියා හා රාජකාරී ඉටුකිරීම සම්බන්ධ පිළිගත හැකි ලිඛිත වාර්තාවන් විගණනයට ඉදිරිපත් නොවූ අතර රු.1,911,667 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ඉහත නිලධාරීන්ට 2023 ජූලි සිට 2024 පෙබරවාරි දක්වා මහපොළ භාර අරමුදල මගින් ලබාගත් අත්තිකාරම් මුදලින් ගෙවා තිබුණි. | ඉදිරියේදී පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව | අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ අරමුණු අතුරින් පහත දැක්වෙන ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් අපොහොසත් වී තිබුණි. | | |
| | (i) ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් සකස් කර නිම කිරීම. | මේ වන විට සකස් කර ඇති ජාතික වෙළෙඳ ප්‍රතිපත්ති කෙටුම්පත ජනාධිපති කාර්යාලයේ ජාත්‍යන්තර වෙළෙඳ අංශ ප්‍රධානීගේද සහභාගිත්වයෙන් මේ සඳහා පත් කර ඇති අති කමිටු නිලධාරීන් සමඟ සමාලෝචනය කර ලෝක වෙළෙඳ සංවිධානයේ තාක්ෂණ සහය ලබා ගනිමින් ගෝලීය වෙළෙඳ තත්වයන්ද සැලකිල්ලට ගෙන තව දුරටත් වැඩි දියුණු කිරීමට කටයුතු කරමින් සිටින බව | වෙළඳ ප්‍රතිපත්තිය සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාල දත්ත පද්ධතිය පවත්වාගෙන යෑම, එම දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම හා දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමග සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම. | ඉදිරියේදී පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව | අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |
| iii) | ජාතික බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම. | ඉදිරියේදී පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව | -එම- |
| (ආ) | දේශීය වෙළඳපල තුල ඇතිවන මිල උච්චාවචනයන් පාලනය කිරීම සඳහා මැදිහත්කරුවකු ලෙස ක්‍රියා කිරීම අමාත්‍යාංශයේ කාර්යයක් වුවද 2022 හා 2023 වර්ෂවල වෙළඳපොලේ සීනි, බිත්තර, ගෑස්, පොහොර, කිරිපිටි, කීරි සම්බා වැනි භාණ්ඩවල විශාල හිඟ තත්ත්ව පැවතීම නිසා මිල ගණන් ඉහළ ගොස් තිබුණු අතර මෙම භාණ්ඩ තොග හිඟවීම් සම්බන්ධව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරීය ප්‍රමාණාත්මක වැටලීම් සංඛ්‍යාවක් සිදුකර නොතිබුණු අතර අමාත්‍යාංශය මඟින්ද ඒ පිළිබඳ නිසි අධීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව | මුලික කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පාරිභෝගිකයා වඩාත් සුරක්ෂිත කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල නීති අණපනත් යාවත්කාලීන හා සංශෝධන කඩිනම් කලයුතු නමුත් 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත, 2003 අංක 36 දරන ජාතික බුද්ධිමය දේපල පනත හා 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිත සේවා පනත සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සංශෝධනය කර නොතිබුණි. | ඉදිරියේදී පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ඇත. | පනත් සංශෝධනය කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ එළවළු, පලතුරු, ගෑස්, පෙට්‍රල් ඇතුලු ප්‍රධාන වෙළඳ භාණ්ඩ වලට අදාලව අමාත්‍යාංශයේ අභ්‍යන්තර වෙළඳ අංශය විසින් සියයට 50 ක ප්‍රගතියක් පවතින බව කාර්යසාධන වාර්තා අනුව පෙන්වාදී තිබුණද ඒ සම්බන්ධ කිසිඳු වාර්තාවක් නිකුත් කර නොතිබුණු අතර ප්‍රධාන වෙළඳ භාණ්ඩයන්ට (වෙළඳ පැතිකඩයන්ට) අදාල එක් එක් රේඛීය අමාත්‍යාංශයන්ගෙන් පවත්වාගෙන යා යුතුව තිබූ තොග ප්‍රමාණයන් හා එක් එක් මාසයන් වල පැවතුනු සත්‍ය තොග ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු එක්රැස් කර ගැනීම අමාත්‍යාංශයේ කාර්යයභාර්යයක් වුවද එම තොරතුරු රැස්කර ගැනීමට නිශ්චිත සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සම්බන්ධීකරණය කිරිම එක් එක් අංශ විසින් සිදු කරනු ලබන අතර ඒ අනුව නිරන්තර මග පෙන්වීම් සිදු කිරීම, උපදෙස් ලබාදීම, රැස්වීම් / ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවත්වීම ආදිය සිදුකරයි. එම ආයතන අතරින් පාරිභෝගියාට සංවේදි ආයතනයක් වන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සම්බන්ධව අවශ්‍ය මග පෙන්වීම් ලබා දිම, රැස්වීම් / සාකච්ඡා ප්‍රගති සමාලෝචන, නිශ්චිත කාලයකට වරක් සිදු කිරිම තුලින් ඔවුන්ට අවශ්‍ය උපදෙස් / මගපෙන්වීම් ලබාදීම සිදු කර ඇති බව | තොරතුරු රැස්කර ගැනීමට විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ඉන්දියානු ණය ක්‍රමය (ICL) යටතේ ආනයන සම්බන්ධීකරණ කටයුතු අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණද ආනයනය කලයුතු භාණ්ඩ, විශ්ලේෂණ වාර්තා හෝ එක් එක් ආනයනකරුවන් විසින් රටතුලට ගෙන්වන ලද භාණ්ඩ ප්‍රමාණයන් වල තොරතුරු අමාත්‍යාංශය විසින් පවත්වාගෙන නොතිබුණි. | ඉන්දියානු ණය යෝජනා ක්‍රමයට අදාළ ප්‍රගති වාර්තා සකස් කර ඇත. එසේ වුවත් 2023 වර්ෂයට අදාළ ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ අත්‍යවශ්‍ය අහාර ද්‍රව්‍ය ආනයනය සිදුවී නොතිබුණි. ආනයනකරුවන්ට අදාළව නිකුත් කරන ලද ලිපි ඇතුලත් කළ ගොනුව/ගොනු මෘදු පිටපත් (Soft copies) ලෙස පවත්වාගෙන යන ලද බව | අත්‍යාවශ්‍ය තොරතුරු විධිමත්ව පවත්වාගත යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 සැප්තැම්බර් 28 දිනැති අමප/21/1543/313/053 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් වෙනත් අමාත්‍යාංශ හා ආයතනවලට අයත් දැනට අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලබන වාහන අමාත්‍යාංශය වෙත විධිමත්ව පවරා ගැනීම සඳහා අනුමැතිය ලැබී තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විට පවරාගෙන නොතිබූ වාහන සංඛ්‍යාව 20 ක් විය. | මේ අතුරින් වාහන කිහිපයක් මේ වන විට පවරාගෙන ඇති අතර, පවරා නොගත් වාහන පවරා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත ඉල්ලීම ඉදිරිපත් කර ඇත. | වාහන විධිමත්ව පවරාගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) අමාත්‍යාංශයේ වාහන 5 ක් වසරකට අධික කාලයක සිට ධාවන තත්ත්වයේ නොමැති වීම නිසා අමාත්‍යාංශයේ ගාල් කර තිබූ අතර තවත් වාහන 02 ක් වසරකට වැඩි කාලයක් සිට අලුත්වැඩියා කටයුතු සඳහා ගරාජය වෙත යොමු කර තිබුණද එම වාහන සම්බන්ධයෙන් 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි 02 (ආ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ වියදම් කළමනාකරණය කිරීම කලයුතු වූ හෙයින් වාහන අලුත්වැඩියා කිරීමට යොමු නොකරන ලද අතර මේවන විට ලංසු කැඳවා ඇත. එසේම නියෝජිත ආයතන වල අමතර කොටස් නොමැති වීම නිසා අලුත්වැඩියා කිරීමට දිගු කාලයක් ගත වී ඇති බව | චක්‍රලේඛය අනුව වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) රාජ්‍ය අමාත්‍යාංශයෙන් ලැබූ මූල්‍ය නොවන වත්කම් කාණ්ඩ 59 ක කාර්යාල උපකරණ අයිතම 534 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් වෙළඳ අමාත්‍යාංශ පරිශ්‍රයේ හා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තු ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි. | මේ වන විට අමාත්‍යාංශයේ විවිධ අංශ වලින් අවශ්‍යතා කැඳවා ඇත. ඒ අනුව ඉදිරියේදී රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 ප්‍රකාරව රජයේ ආයතන වෙත ලබා දීමට කටයුතු කරන බව | වත්කම් මනාව කළමනාකරණය කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය අමාත්‍යාංශයෙන් ලබාගත් භාණ්ඩ 50 කට අයත් අයිතම් 116 ක් අමාත්‍යාශය විසින් බාහිර ආයතන 04 කට නිකුත් කර තිබුණද ඒ සඳහා ලැබීම් නියෝග ලබාගෙන නොතිබුණු අතර නිකුත් කිරීම් නියෝග 05 කට අයත් භාණ්ඩ අයිතම් 80 කට අදාල වටිනාකම් නිකුත් කිරීම් නියෝගවල සඳහන් නොකර නිකුත් කිරීම් සිදුකර තිබිණි. | -එම- | -එම- |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තිරසාර සංවර්ධනය යටතේ ඉලක්කයක් ලෙස ආහාර හිඟයක් ඇති නොවන ලෙස ආහාර සංචිතයක් පවත්වා ගැනීම අධීක්ෂණය කිරීම දක්වා තිබුණද එලෙස ආහාර සංචිත පවත්වා ගැනීම සිදුකර නොතිබුණු අතර සංචිත පවත්වාගෙනයාමට නිසි ක්‍රමවේදයක් ඇති කිරීමටද කටයුතු කර නොතිබුණි. | සහල් සංචිතයක් පවත්වා ගැනීමට මහා භාණ්ඩාගාරය වෙතින් රු. මිලියන 1,996 ක ප්‍රතිපාදන ඉල්ලුම් කළද, ලබා දෙන ලද රු.මිලියන100 ක ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවූ බව. | ආහාර සංචිත පවත්වා ගැනීමේ නිසි ක්‍රමවෙදයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | වෙළඳපොල තුල භාණ්ඩවල මිල අසාමාන්‍ය ලෙස ඉහල ගොස් ඇති අවස්ථා වල එළවළු පළතුරු ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල පාලනය කිරිම තුලින් ජීවන වියදම් පහළ මට්ටමක පැවැත්වීමට අත්‍යාවශ්‍ය ආහාර වර්ග 10 ක් ආනයනයට නිර්දේශ ලබාදුන්නද මින් තිරිඟු පිටි පමණක් ආනයනය කර තිබුණි. | ඉදිරියේදී පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව. | අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල පාලනයට නිසි ක්‍රමවේදයක් අනුගමනය කර ක්‍රියාත්මක කල යුතුය. |